සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

| 22 | S | I |
|---|---|---|

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020

**Second Term Test - Grade 13 - 2020**

විභාග අංකය .............................   භූගෝල විද්‍යාව I   කාලය පැය තුනයි

- **මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් සමන්විත වේ.**
- **I කොටස බහුවරණ ප්‍රශ්න 40කින් යුක්ත වන අතර ඒවාට පිළිතුරු මෙම පත්‍රයේම සැපයිය යුතුය.**
- **II කොටසෙහි ප්‍රශ්න දෙකටම පිළිතුරු සැපයිය යුතුය. III කොටස ප්‍රශ්න හතරකින් සමන්විත වන අතර තෝරා ගත් ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සැපයිය යුතුය.**
- **මෙම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම සඳහා ශ්‍රී ලංකා මෙට්‍රික් සිතියම් කොටසක් ද ලෝක ආකෘති සිතියමක් ද සපයනු ලැබේ.**


## <u>I කොටස</u>


- **වඩාත් නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.**


01). සැබෑ භූමියේ 8 $Km^2$ ක ව්‍යාප්තියක් සහිත ජලාශයක් 1:50,000 හු ලක්ෂණ සිතියමක නිරූපණය කරනු ලබන්නේ වර්ග සෙන්ටිමීටර් කීයකින් ද?
i. 2 $cm^2$   ii. 4 $cm^2$   iii. 8 $cm^2$   iv. 16 $cm^2$   v. 32 $cm^2$   (...........)

02). කේන්ද්‍රික ප්‍රවණතා පිළිබඳ මිනුම් පමණක් දැක්වෙන නිවැරදි වරණය තෝරන්න.
i. මධ්‍යස්ථය, පරාසය, මධ්‍යන්‍යය
ii. මධ්‍යස්ථය, මාතය, මධ්‍යන්‍ය අපගමනය
iii. මධ්‍යස්ථය, මාතය, මධ්‍යන්‍යය
iv. සම්මත අපගමනය, මාතය, මධ්‍යන්‍යය
v. සම්මත අපගමනය, මධ්‍යන්‍ය අපගමනය, අන්තර් චාතුර්ථික පරාසය   (...........)

03). පහත දැක්වෙන උපාංග අතරින් භූගෝලීය තොරතුරු පද්ධතියට (GIS) අයත්වන ආදාන උපාංගයක් හා ප්‍රතිදාන උපාංගයක් පමණක් පිළිවෙළින් නිවැරදි ව දැක්වෙන අක්ෂර ඇතුළත් වරණය තෝරන්න.







i. A හා B පමණි.   ii. B හා C පමණි.   iii. A හා D පමණි.
iv. B හා D පමණි.   v. D හා B පමණි.   (...........)

04). ශ්‍රී ලංකාවේ 1:50,000 හු ලක්ෂණ සිතියම් ශ්‍රේණියේ එකට එකතු කර එක් පත්‍රයක් ලෙස මුද්‍රණය කර ඇති සිතියම් පත්‍ර දෙකක් දැක්වෙන වරණය තෝරන්න.
i. 57 - 58   ii. 02 - 03   iii. 45 - 46   iv. 19 - 20   v. 90 – 91
(...........)


05). ගුවනේ එක් ස්ථාවර ස්ථානයක නිත්‍ය වශයෙන් පිහිටුවා පෘථිවි භ්‍රමණයට සාපේක්ෂ ව සමාන කාලයකින් පරිභ්‍රමණය වන අයුරින් ස්ථාපිත කර ඇති චන්ද්‍රිකාවන් හඳුන්වනු ලබන්නේ,

i. භූ සමකාලීන චන්ද්‍රිකා ලෙස ය.
ii. ධ්‍රැවක කක්ෂ චන්ද්‍රිකා ලෙස ය.
iii. කාලගුණ චන්ද්‍රිකා ලෙස ය.
iv. භූ ස්ථාවර චන්ද්‍රිකා ලෙස ය.
v. සන්නිවේදන චන්ද්‍රිකා ලෙස ය. (..........)

06). මුල් කාලයේ දී යුධමය හා ආරක්ෂක කටයුතු සඳහා භාවිතා කරන ලද, පසුව නොමිලයේ ම සාමාන්‍ය ජනතාවගේ ප්‍රයෝජනය සඳහා නිදහස් කල භූගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතිය නිර්මාණය කරන ලද්දේ කවුරුන් විසින්ද?

i. චීන ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් ය.
ii. ඉන්දීය ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් ය.
iii. රුසියානු ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් ය.
iv. ජපන් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් ය.
v. ඇ.එ.ජ. ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් ය. (..........)

07). පහත දැක්වෙන භූ ලක්ෂණ නිවැරදි ව පිළිවෙළින් නම් කර ඇති වරණය තෝරන්න.




i. නෙරුව, හැඩපලු ගංගාව, කපොල්ල
ii. නිම්නය, හැඩපලු ගංගාව, උත්තල බෑවුම
iii. නෙරුව, හැඩපලු ගංගාව, අවතල බෑවුම
iv. නිම්නය, හැඩපලු ගංගාව, අවතල බෑවුම
v. නෙරුව, හැඩපලු ගංගාව, උත්තල බෑවුම (..........)

08). 10 ශ්‍රේණියේ සිසුන් ගේ උස හා බර යන දත්තයන් අයත්වන්නේ පහත දැක්වෙන කුමන දත්ත වර්ගයට ද?

i. සන්තතික දත්ත
ii. නාම මාත්‍රික දත්ත
iii. අනුපාත දත්ත
iv. විවික්ත දත්ත
v. සමූහිත දත්ත (..........)

09). සිරස් ගුවන් ඡායාරූප ලබා ගැනීමේ දී කැමරාවේ ප්‍රකාශ අක්ෂය පොළවට ලම්බාකාර ව පිහිටා තිබීම නිසා ඇතිවන්නා වූ අවාසිදායක තත්ත්වයක් වන්නේ,

i. ත්‍රිමාණ ලක්ෂණ පැහැදිලි ව නිරූපණය වීම යි.
ii. තොරතුරු විශාල ප්‍රමාණයක් අන්තර්ගත වීමයි.
iii. තොරතුරු විශ්ලේෂණය අසීරු වීමයි.
iv. ලැබෙන තොරතුරු ප්‍රමාණවත් නො වීමයි.
v. ත්‍රිමාණ ලක්ෂණ පැහැදිලි ව නිරූපණය නො වීමයි. (..........)

10). පහත දැක්වෙන ස්ථාන අතරින් ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතියේ. පැසිෆික් සාගරයේ ස්ථානගත කර ඇති ඇන්ටනා මධ්‍යස්ථාන දෙකක් දැක්වෙන නිවැරදි වරණය තෝරන්න.

A - කොළරාඩෝ / B හවායි / C ඇසෙන්ෂන් / D දියාගෝ ගාර්ෂියා / E ක්වාලෙයින්

i. A, C
ii. B, D
iii. C, E
iv. B, E
vi. D, E (..........)

11). ජලය මගින් ශුෂ්ක ප්‍රදේශවල නිර්මාණය කරනු ලබන භූ රූප පමණක් ඇතුළත්වන වරණය තෝරන්න

i. ගවුර, සොයිගම, යාඩැම්
ii. ගවුර, සොයිගම, යාඩැම්
iii. යාඩැම්, ප්ලයා විල්, සලපිල
iv. බහාඩා, ප්ලයා විල්, සලපිල
v. බහාඩා, කඳුරු, මේසාව (..........)

12). එල්-නිනෝ සංසිද්ධිය හේතුවෙන් නැගෙනහිර පැසිෆික් සාගරික ප්‍රදේශය ආශ්‍රිත ව ප්‍රධාන ලෙස ම සිදුවන්නේ,

i. සාගර ජලය අසාමාන්‍ය ලෙස මිදී යාම යි.
ii. සාගර ජලයේ උෂ්ණත්වය වැඩි වීම නිසා වායු පීඩනයේ හා සුළං රටාවේ වෙනස් වීම ය.
iii. සාගර ජලයේ උෂ්ණත්වය වැඩි වීම නිසා මත්ස්‍ය ගහනය වැඩි වීම යි.
iv. සාගර ජලයේ උෂ්ණත්වය අඩු වීම නිසා වායු පීඩනයේ හා සුළං රටාවේ වෙනස් වීම ය.
v. සාගර ජලයේ උෂ්ණත්වය අඩු වීම නිසා ධීවර කටයුතු අපහසු වීම යි. (...........)

13). පහත දැක්වෙන ලක්ෂණ දක්නට ලැබෙන පස් වර්ගය තෝරන්න.


- සශ්‍රීකත්වයෙන් ඉහළ ය.
- කඳුකර හා නිම්න ප්‍රදේශවලත්, රැළි බිම්වලත් දක්නට ලැබේ.
- කොකෝවා, කෙසෙල් වගාව සඳහා ඉතා යෝග්‍ය වේ.

i. රතු දුඹුරු පස　　ii. දියළු පස　　iii. රතු දුඹුරු ලැටසොල්ස් පස
iv. ග්‍රැමුසොල්ස් පස　　v. රතු කහ පොඩ්සොලික් පස (...........)

14). ඇල්පයින් ග්ලැසියර් ආශ්‍රිත ව දැකිය හැකි දිය ඇළි නිර්මාණය වීමට උපකාරී වන ග්ලැසියර් ආශ්‍රිත භූ ලක්ෂණය වන්නේ,

i. සර්ක　　ii. ඩ්‍රම්ලින්　　iii. අරේට　　iv. එස්කර්　　v. ලම්බ නිම්න (...........)

15). ආතතීය චලන ආශ්‍රිත ව නිර්මාණය වන සුවිභේද නිම්නය, උඩුකුරු විභේදය හා හෝස්ටය නිවැරදි ව අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුර ඇතුළත් වරණය තෝරන්න.




i. A, C, B　　ii. B, C, A　　iii. A, B, C　　iv. C, B, A　　v. B, A, C (...........)

16). අන්තර් නිවර්තන අභිසරණ කලාපය (ITCZ) දිවයිනට දකුණින් පිහිටා තිබීම නිසා ශ්‍රී ලංකාවට ඇතිවන්නා වූ වර්ෂාපතන රටාව වන්නේ,

i. ඊශාන දිග මෝසම ය.　　ii. වාසුළි ය.　　iii. නිරිත දිග මෝසම ය.
iv. පළමු අන්තර් මෝසම ය.　　v. දෙවන අන්තර් මෝසම ය. (...........)

17). පෘථිවි අභ්‍යන්තරයේ තැන්පත් ව ඇති ජලයෙන්, අවසාදිත තට්ටු අතර තැන්පත් ව ඇති ජලය හඳුන්වනු ලබන්නේ,

i. මැග්මීය ජලය ලෙස ය.　　ii. මතුපිට ජලය ලෙස ය.　　iii. උල්කා ජලය ලෙස ය.
iv. සහජාත ජලය ලෙස ය.　　v. වායුගෝලීය ජලය ලෙස ය. (...........)

18). ගංගාවක භාරය පරිවහනය කරන විධි පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.

i. ද්‍රාවණය , පිනුම් ගමන, පෙරළිගමන　　ii. පිනුම් ගමන , සංකර්ෂණය , ද්‍රාවණය
iii. පෙරළිගමන, අවලම්බනය, ද්‍රාවණය　　iv. අවලම්බනය, පිනුම්ගමන , පෙරළිගමන
v. ඉහත සියල්ල ම (...........)

19). උතුරු හා දකුණු අර්ධ ගෝල දෙකෙහි ම අක්ෂාංශ $50^0$-$60^0$ අතර වූ කලාපයක විහිදීමක් දක්නට ලැබෙන්නේ,


i. නිවර්තන කලාපීය වනාන්තර ය.
ii. මධ්‍යධරණී වන ලැහැබ් ය.
iii. සෞම්‍ය කලාපීය වනාන්තර ය.
iv. තුන්ද්‍රා වනාන්තර ය.
v. නිවර්තන සැවානා වනාන්තර ය. (...........)

20). වායුගෝලයේ ස්තරායනය දක්වනු ලබන්නේ, පොළෝතලයේ සිට ඉහළට යන විට,

i. වායුගෝලයේ පීඩන වෙනස්වීම පදනම් කරගෙන ය.
ii. වායුගෝලයේ සිරස් උෂ්ණත්ව වෙනස්වීම පදනම් කරගෙන ය.
iii. වායුගෝලයේ ඝනත්වයේ වෙනස්වීම පදනම් කරගෙන ය.
iv. වායුගෝලයේ උන්නතාංශය පදනම් කරගෙන ය.
v. වායුගෝලයේ පීඩන හා උෂ්ණත්ව වෙනස්වීම පදනම් කරගෙන ය. (...........)

21). පාෂාණ බණ්ඩනය, ඔක්සිකරණය, කාබනීකරණය, සජලකරණය මෙන් ම ද්‍රාවණය හා නිධි සාදනය යන ක්‍රියාවලි මඟින් භූ රූප නිර්මාණය වීමේ ක්‍රියාවලිය සිදුවන්නේ,

i. මතුපිට ජලය මගිනි.
ii. වායුගෝලීය ජලය මගිනි.
iii. භූගත ජලය සංසරණය මගිනි.
iv. සාගර තරංග මගිනි.
v. ගලන ජලය මගිනි. (...........)




22). ශ්‍රී ලංකා වන ජීවී රක්ෂිත අතර ජාතික වනෝද්‍යානයක් හා දැඩි ස්වභාවික රක්ෂිතයක් නිවැරදි ව පිළිවෙළින් දැක්වෙන අක්ෂර ඇතුළත් වරණය තෝරන්න.

i. A, E
ii. D, C
iii. B, C
iv. D, B
v. B, E (...........)

23). ලොව සිදුවන භූමිකම්පාවල 70% කටත් වඩා අපිකේන්ද්‍ර පිහිටා ඇත්තේ,

i. හිමාල කඳු වැටි කලාපයේ ය.
ii. පරි පැසිෆික් සාගරික කලාපයේ ය.
iii. මධ්‍ය අත්ලන්තික් සාගරික වැටි කලාපයේ ය.
iv. අප්‍රිකානු සුවිභේද නිම්න කලාපයේ ය.
v. මධ්‍යධරණී මුහුද අවට කලාපයේ ය. (...........)

24). ශ්‍රී ලංකාවේ ගංගාවන් අතරින් වැඩි ම වර්ෂාපතනයක් (වාර්ෂික වර්ෂාපතනය මි.මී. 3605) ලැබෙන ගංගා ද්‍රෝණිය අයත් වන්නේ කුමන ගංගාවට ද?

i. මහවැලි ගඟ
ii. මල්වතු ඔය
iii. වලවේ ගඟ
iv. කැලණි ගඟ
v. කළු ගඟ (...........)


25). වැලි, ගල් කැට හා පාෂාණ කුට්ටි සමඟ වේගයෙන් වෙරළ වෙත දමා ගසනු ලබන රළ පහර හඳුන්වනු ලබන්නේ,

i. පෙර පහර ලෙස ය.
ii. පිළිසෝදාව ලෙස ය.
iii. පසු පහර ලෙස ය.
iv. සිව් පහර ලෙස ය.
v. අනුතීර ප්ලාවිතය ලෙස ය. (...........)

26). කෘෂි පාදක කර්මාන්ත පමණක් දැක්වෙන වරණය තෝරන්න.

i. ටයර්, විදුලි උපකරණ, කුළුබඩු, ලී බඩු
ii. ටියුබ්, සීනි, තේ, කපු පිළි
iii. ටියුබ්, සීනි, තේ, යකඩ හා වානේ
iv. සීනි, නැව්, විදුලි උපකරණ, ටයර්
v. ටයර්, ටියුබ්, මෝටර් රථ, නැව් (...........)

27). පහත දැක්වෙන අප්‍රිකානු රටවල් අතරින් 2050 වන විට ලෝකයේ ජන සංඛ්‍යාව අධිකත ම රටවල් 10 අතරට පැමිණෙතැයි අපේක්ෂා කරන පහත රටවල් තුන දැක්වෙන පිළිතුර තෝරන්න.




නයිජීරියාව - ඉතියෝපියාව - කොංගෝ ජනරජය

i. B, C, D    ii. A, B, E    iii. A, C, E

iv. B, C, E    v. A, B, C    (...........)

28). භෞතික භූගෝල විද්‍යා විෂය ක්ෂේත්‍රයට අයත් වන විෂයයන් පමණක් අඩංගු වන නිවැරදි වරණය තෝරන්න.

i. සංවර්ධන භූගෝල විද්‍යාව, ආර්ථික භූගෝල විද්‍යාව, නාගරික භූගෝල විද්‍යාව

ii. දේශගුණ විද්‍යාව, ආර්ථික භූගෝල විද්‍යාව, ඓතිහාසික භූගෝල විද්‍යාව

iii. ජෛව භූගෝල විද්‍යාව, දේශගුණ විද්‍යාව, වෙරළ භූගෝල විද්‍යාව

iv. භූ රූප විද්‍යාව, ආර්ථික භූගෝල විද්‍යාව, පුරා භූගෝල විද්‍යාව

v. ආර්ථික භූගෝල විද්‍යාව, පාරිසරික භූගෝල විද්‍යාව, නාගරික භූගෝල විද්‍යාව    (...........)

29). - සංචාරක ධීවර කර්මාන්තය
- සල ගොවිතැන
- ආහාර සොයා කාලීන ව සංක්‍රමණය වීම
- ඍතුමය දේශගුණික වෙනස්වීම්

ඉහත දැක්වෙන හේතූන් නිසා නිර්මාණය වන්නා වූ ජනාවාස වර්ගය හඳුන්වනු ලබන්නේ,

i. තරුණ ගම්මාන    ii. ධීවර ගම්මාන    iii. හදබිම් ජනාවාස

iv. නාගරික ජනාවාස    v. තාවකාලික හා අර්ධ ස්ථාවර ජනාවාස    (...........)

30). ශ්‍රී ලංකාවේ නාගරීකරණ ක්‍රියාවලියේ ක්‍රමික වර්ධනය කෙරෙහි බලපාන ප්‍රධාන ක්‍රම පමණක් ඇතුළත් වන නිවැරදි වරණය තෝරන්න.

A. ග්‍රාමීය නාගරික සංක්‍රමණ

B. නාගරික ප්‍රදේශවල ස්වාභාවික ජන සංඛ්‍යා වර්ධනය

C. ග්‍රාමීය ප්‍රදේශ නාගරික පරිපාලන සීමා තුළට ඇතුළත් කිරීම

i. A පමණි.    ii. B පමණි.    iii. A හා C පමණි.

iv. B හා C පමණි.    v. A, B හා C    (...........)

31). ලොව පෙට්‍රෝලියම් නිෂ්පාදනයේ ප්‍රමුඛයන් වුව ද පෙට්‍රෝලියම් ආනයනය කරන රටවල් දෙකක් දැක්වෙන වරණය තෝරන්න.

i. ඇමරිකා එක්සත් ජනපදය හා ජපානය    ii. ඉන්දියාව හා රුසියාව

iii. කැනඩාව හා චීනය    iv. චීනය හා ජපානය


v. ඇමරිකා එක්සත් ජනපදය හා චීනය    (...........)

32). 1963 දී ක්‍රියාත්මක කරන ලද ලෝක ආහාර හා කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන ලෝක සැලැස්ම නම් වැඩසටහන වර්තමානයේ හඳුන්වනු ලබන්නේ,

i. ජාන තාක්ෂණය    ii. හරිත විප්ලවය    iii. දෙමුහුන් තාක්ෂණය

iv. ජෛන්ද්‍රීය කෘෂිකර්මය    v. මුහුන් කිරීම    (...........)

33). මෙම ශ්‍රී ලංකා සිතියමෙහි මිලියනකට වැඩි ජන සංඛ්‍යාවක් වෙසෙන දිස්ත්‍රික්ක පමණක් දැක්වෙන වරණය තෝරන්න.




i. D, E, F    ii. A, B, D    iii. A, C, E

iv. B, D, E    v. B, C, D    (...........)

34). කාර්යයන් හි ස්වභාවය අනුව ජනාවාස බෙදා වෙන්කර දැක්විය හැකි ආකාර පමණක් ඇතුළත් වන නිවැරදි වරණය තෝරන්න.

i. රේඛීය, විසිරුණු, මංසන්ධි
ii. ග්‍රාමීය, නාගරික, අර්ධ නාගරික
iii. ග්‍රාමීය, නාගරික, ගැමි නාගරික
iv. ග්‍රාමීය, නාගරික, වතු
v. ග්‍රාමීය, විකීර්ණ, වතු (...........)


35). කෘෂිකාර්මික තාක්‍ෂණය යටතේ ශ්‍රී ලංකාවේ වැඩි අවධානය යොමු නොකළ ක්ෂේත්‍රය දැක්වෙන වරණය තොරන්න.

i. හරිතාගාර
ii. වාරි තාක්‍ෂණය
iii. නවීන යන්ත්‍ර සූත්‍ර භාවිතය
iv. ජාන තාක්‍ෂණය
v. ඓන්ද්‍රිය ගොවිතැන (...........)

36). 2014 වර්ෂය වන විට ලොව රටවල් අතර නාගරීකරණ ප්‍රතිශතය 95% ට වැඩි මට්ටමක පැවතුණු ආසියාතික රටක් හා යුරෝපා රටක් පිළිවෙළින් දැක්වෙන පිළිතුර ඇතුළත් වරණය කුමක් ද ?

i. කටාර් රාජ්‍යය හා ප්‍රංශය
ii. උරුගුවේ හා ඉන්දියාව
iii. තායිවානය හා ජර්මනිය
iv. සිංගප්පූරුව හා බෙල්ජියම
v. ජපානය හා නෝර්වේ (...........)

37). පහත දැක්වෙන ජන සංඛ්‍යා පිරමීඩ ඒවායේ ක්‍රමික වර්ධනය අනුව අක්‍ෂර වලින් පෙළගැස්වූ විට ලැබෙන නිවැරදි පිළිතුර දැක්වෙන වරණය තෝරන්න.




i. DBAC
ii. BDAC
iii. ABCD
iv. DCBA
v. DABC (...........)

38). ලෝකයේ නිෂ්පාදනය කරනු ලබන යපස්වලින් 98% ක් ම යොදාගනු ලබන්නේ,

i. යකඩ හා වානේ නිෂ්පාදනයට ය.
ii. මෝටර් රථ නිෂ්පාදනයට ය.
iii. නැව් කර්මාන්තයට ය.
iv. විදුලි උපකරණ නිෂ්පාදනයට ය.
v. ගුවන් යානා කර්මාන්තයට ය. (...........)

39). ඇතැම් කාලවලදී ආනයනික තීරු බදු අඩු කිරීම හෝ ඉවත් කිරීම දේශීය ගොවියාට බලපාන අවස්ථා ඇත. එසේ නිතර ම බලපෑමට ලක්වන බෝග වර්ග දෙකක් වන්නේ,

i. ලොකු ළූණු හා රතු ළූණු
ii. අර්තාපල් හා පරිප්පු
iii. අර්තාපල් හා ලොකු ළූණු
iv. මිරිස් හා බෝංචි
v. පරිප්පු හා අර්තාපල් (...........)

40). එක්සත් ජාතීන්ගේ සංවිධානය හා ලෝක බැංකුව වැනි බොහෝ අන්තර් ජාතික සංවිධානය මුහුණ දෙන ප්‍රධානත ම අභියෝගයක් වී ඇත්තේ සමාජ, ආර්ථික හා දේශපාලන තත්ත්වයන් සමග බැඳී පවතින,

i. අවතැන් වීම යි.
ii. දරිද්‍රතාවය යි.
iii. ආබාධිතබව යි.
iv. ආහාර සුරක්ෂිතතාවය යි.
v. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය යි. (...........)

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved



දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020

**Second Term Test - Grade 13 - 2020**

භූගෝල විද්‍යාව I

## II කොටස

- **මෙම කොටසේ ප්‍රශ්න දෙකටම පිළිතුරු සපයන්න.**

01). ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද 1:50,000 පරිමාණයේ භූ ලක්ෂණ සිතියමේ කොටසක් ඔබට සපයා ඇත. එහි සමෝච්ච රේඛා අන්තරය මීටර් 20කි. එම සිතියම පදනම් කර ගනිමින් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. අංක 1 චතුරස්‍රය තුළ දක්නට ලැබෙන පොදු සේවා සපයන ආයතන දෙකක් නම් කරන්න. (ල.02)

ii. අංක 2 චතුරස්‍රය තුළ දක්නට ලැබෙන ජලවහන ලක්ෂණ දෙකක් නම් කරන්න. (ල.02)

iii. අංක 3 න් දක්වා ඇති ගඟ දිගේ විහිදෙන පරිපාලන මායිම කුමක් ද ? (ල.02)

iv. අංක 4 චතුරස්‍රය තුළ දැක්වෙන්නේ කුමක් ද? (ල.01)

v. a). සිතියම් ප්‍රදේශයේ දක්නට ලැබෙන ප්‍රධාන භූමි පරිභෝග වර්ගය කුමක් ද ? (ල.01)

b). ඉහත නම්කල බෝගයට අමතර ව ප්‍රදේශයේ දක්නට ලැබෙන වෙනත් භූමි පරිභෝග වර්ග දෙකක් නම් කරන්න. (ල.02)

vi. අංක 5 න් දක්වා ඇති B045 මාර්ග කොටසේ දිග ආසන්න කිලෝමීටරයට ගණනය කර දක්වන්න. (ල.02)

vii. සිතියම් ප්‍රදේශයේ භූමි පරිභෝගය රටාව කෙරෙහි භූ විෂමතාව හා ජලවහනය හේතු වී ඇති ආකාරය පැහැදිලි කරන්න. (ල.04)

viii. ප්‍රවාහන පද්ධතිය ප්‍රදේශයේ සංවර්ධනය කෙරෙහි බලපා ඇති ආකාරය පිළිබඳ අදහස් දක්වන්න. (ල.04)

02). ඔබ වෙත සපයා ඇති ලෝක ආකෘති සිතියමෙහි පහත සඳහන් දෑ ලකුණු කර නම් කරන්න. සම්මත වර්ණ සංකේත භාවිතා කිරීමට සැළකිලිමත් වන්න. (ල.10)

i. මැගලන් සමුද්‍ර සන්ධිය

ii. ගයනා උස්බිම්

iii. ටැංගනිකා විල

iv. ගල්ෆ් උණුසුම් ප්‍රවාහය

v. පර්ත් නගරය

vi. බෝල්ටික් මුහුද

vii. ඇලූෂියන් ආගාධය

vii. මධ්‍යධරණී මුහුද හා රතු මුහුද සම්බන්ධ කරන ඇළ මාර්ගය

ix. ආසියානු මහාද්වීපයේ දිග ම ගංගාව

ix. චීනයට පසු Co.Vid-19 වෛරස් ආසාදිතයන් වැඩි ම ප්‍රමාණයක් වාර්තා වූ ආසියාතික රට

## III කොටස

03). i. දත්ත යන්න හඳුන්වන්න. (ල.02)

ii. සමූහිත දත්ත හා අසමූහිත දත්ත වෙන ම හඳුන්වන්න. (ල.03)


iii. ප්‍රාථමික දත්ත රැස් කිරීමේ ක්‍රමයක් භාවිතයෙන් දත්ත රැස් කරන ආකාරයක් විස්තර කරන්න. (ල.04)

iv. භූගෝල විද්‍යාත්මක අධ්‍යයනවලදී ද්විතියික දත්ත භාවිතයේ වාසි හා අවාසි පැහැදිලි කරන්න. (ල.06)

04). i. දූරස්ථ සංවේදය (Remote Sensing) යනු කුමක් ද? (ල.02)

ii. කක්ෂීය ගමන් රටාව හා ස්ථානගත කර ඇති ආකාරය අනුව හඳුනාගත හැකි පහත දැක්වෙන චන්ද්‍රිකා වර්ග දෙක නම් කර ඉන් එක් වර්ගයක් කෙටියෙන් විස්තර කරන්න. (ල.04)

iii. දූරස්ථ සංවේද ක්‍රියාවලිය සඳහා භාවිතා කරනු ලබන දූරස්ථ සංවේදන වේදිකා වර්ග තුන පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ල.06)




iv. වර්තමානයේ දූරස්ථ සංවේද, ශිල්ප ක්‍රම හා තාක්ෂණය භාවිතයට ගනු ලබන ක්ෂේත්‍රයක භාවිතය උදාහරණ සහිතව විස්තර කරන්න. (ල.03)

05). i. අපකිරණය මැනීම සඳහා භාවිතා කරන මිනුම් වර්ග තුනක් නම් කරන්න. (ල.03)

- වර්ෂ 2009 සිට 2018 දක්වා ශ්‍රී ලංකාවේ නැවත වගා කල තේ වගා බිම් ප්‍රමාණ පිළිබඳ දත්ත පහත වගුවේ දැක්වේ.

**නැවත තේ වගා කල බිම් (හෙක්ටයාර)**

| වර්ෂය | භූමි ප්‍රමාණය |
|---|---|
| 2009 | 1218 |
| 2010 | 1683 |
| 2011 | 1851 |
| 2012 | 1832 |
| 2013 | 1748 |
| 2014 | 1293 |
| 2015 | 1476 |
| 2016 | 1060 |
| 2017 | 944 |
| 2018 | 1027 |

මූලාශ්‍රය : සමාජ ආර්ථික දත්ත 2019, ශ්‍රී ලංකා මහ බැංකුව

i. 2009-2018 කාලය තුල නැවතත් වගා කළ බිම් ප්‍රමාණයයේ මධ්‍යන්‍යය සොයන්න. (ල.02)

ii. මධ්‍යන්‍යය අපගමනය ගණනය කරන්න. ඒ සඳහා $\left(MD = \frac{\sum|x-\bar{x}|}{n}\right)$ සූත්‍රය උපයෝගී කර ගන්න. (ල.04)

iii. මෙම දත්ත අපගමණ ප්‍රස්ථාරයක නිරූපණය කරන්න. (ල.06)

06). i. භූගෝලීය තොරතුරු පද්ධතියක (Geographic Information System) දත්ත ගබඩා කිරීම සඳහා භාවිතා කරනු ලබන ප්‍රධාන ආකෘති වර්ග දෙක නම් කරන්න. (ල.02)

ii. ඉහත නම් කල දත්ත ආකෘති මගින් ලක්ෂ්‍යය (Point), රේඛා (Line), කලාප/බහුඅස්‍ර (Polygon) යන මූලික සංකේත ආකාර/රූපමිතින් (Topolgy) නිරූපණය කරන ආකාරය කටු සටහන් භාවිතයෙන් විස්තර කරන්න. (ල.04)

iii. භූගෝලීය තොරතුරු පද්ධතියක ප්‍රයෝජන දෙකක් පැහැදිලි කරන්න. (ල.04)

iv. භූගෝලීය තොරතුරු පද්ධති භාවිතා කරනු ලබන ක්ෂේත්‍ර දෙකක් නම් කර ඉන් එකක් විස්තර කරන්න. (ල.05)

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

22 S II

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020

**Second Term Test - Grade 13 - 2020**

භූගෝල විද්‍යාව II කාලය පැය තුනයි

- **මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විතය.**
- **එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න <u>දෙකක් වත්</u> තෝරාගෙන ප්‍රශ්න <u>පහකට</u> පිළිතුරු සපයන්න.**


## I කොටස (<u>භෞතික භූගෝල විද්‍යාව</u>)

02) i) වායුගෝලීය සුළං සංසරණය දැක්වෙන මෙම රූප සටහනෙහි A, B, C ලෙස දක්වා කර ඇති ප්‍රධාන සුළං වර්ග තුන නම් කරන්න. (ල.3)

ii) කෙපන්ගේ දේශගුණ වර්ගීකරණයට අයිති නිවර්තන දේශගුණ (A) වර්ගයට අයත් වන උප වර්ග තුන නම් කර ඉන් එක් වර්ගයක ලක්ෂණ පැහැදිලි කරන්න.

iii) දේශගුණ විවිධත්වය මානව කටයුතු කෙරෙහි බලපාන ආකාරය කරුණු තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

iv) ශ්‍රී ලංකාව තුළ ප්‍රවාහනය හා බලශක්තිය යන ක්ෂේත්‍ර තුළ හරිතාගාර වායු වර්ග මුදාහැරීම පාලනයට හා අවම කිරීමට රජය ගෙන ඇති පියවර තුනක් නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ල.6)





02) i) ලෝකයේ මහද්වීපය හා සාගර බිහිවී ඇති තැටි චලන ආශ්‍රිත චලන වලදී හඳුනාගත හැකි මායිම් වර්ග 03 නම් කරන්න. (ල.3)

ii) තැටි මායිම් කලාප දැක්වෙන මෙම සිතියමෙහි A, B, C ලෙස නම් කර ඇති ප්‍රධාන භූ තැටි නම් කර, එම තැටි කලාපවල පිහිටි රටවල් තුන බැගින් වෙන වෙනම නම් කරන්න. (ල.6)


iii) සම්පීඩන බලවේග නිසා නිර්මාණය වන භූ රූප තුනක් ඇඳ ඒවායේ නිර්මාණ ක්‍රියාවලිය විස්තර කරන්න. (ල.6)

iv) භූමිකම්පා නිසා ඇතිවන බලපෑම් තුනක් නම් කර එකක් විස්තර කරන්න. (ල.5)



03) i) ස්කන්ධ චලනයක් යනු කුමක් ද? (ල.3)

ii) A, B, C හා D ලෙස දක්වා ඇති පහත නායයෑම් වර්ග නිවැරදිව හඳුනාගෙන නම් කරන්න. (ල.4)




iii) නායයෑම් ඇතිවිය හැකි ප්‍රදේශ තුනක් හා නායයෑම් ඇතිවීමට පෙර හඳුනාගත හැකි ලක්ෂණ තුනක් වෙන වෙනම නම් කරන්න. (ල.6)

iv) නායයෑම් ඇතිවීමට බලපාන සාධක තුනක් නම් කර ඉන් දෙකක් විස්තර කරන්න. (ල.7)

04) i) ආපදාවක් හා උපද්‍රවයක් අතර වෙනස දක්වන්න. (ල.3)

ii) a). පහත දැක්වෙන මෑත කාලයේ ලෝකයේ ඇති වූ ස්වාභාවික ආපදාවන් ප්‍රධාන කාණ්ඩ තුනට වර්ගීකරණය කර නැවත ලියා දක්වන්න.

A. ඇමසන් වනාන්තරය ආශ්‍රිත ව ඇති වූ ලැව්ගිනි තත්ත්වය (2019 නොවැම්බර්)

B. ෆීජි දූපත්වලට බලපෑ සුළි කුණාටු තත්ත්වය (2019 දෙසැම්බර්)

C. නැගෙනහිර අප්‍රිකාවේ ඇති වූ ජල ගැලීම් (2019 දෙසැම්බර්)

D. පිලිපීනයේ ටාල් යමහල විදාරණය වීම (2020 ජනවාරි)

E. අප්‍රිකාවේ හා දකුණු ආසියාවේ කාන්තාර පළඟැටි ආක්‍රමණය (2020 ජනවාරි)

F. පුවර්ටො රිකෝ හි ඇති වූ භූ කම්පනය (2020 ජනවාරි) (ල.3)

b). ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ හා වියළි කලාපයේ සුලභ ම ආපදාවක් බැගින් පිළිවෙළින් නම් කරන්න. (ල.2)

iii) ලෝකයේ විශේෂිත කලාපයන්ට පමණක් බලපාන උපද්‍රවයක් වන සුනාමි ඇතිවීමට බලපාන හේතු තුනක් නම් කර ඉන් එක් ක්‍රියාවලියක් පැහැදිලි කරන්න. (ල.6)

iv) ස්වාභාවික ආපදාවන් තීව්‍ර කිරීමට බලපාන මානුෂ ක්‍රියාකාරකම් තුනක් විස්තර කරන්න. (ල.6)

# II කොටස - මානුෂ භූගෝල විද්‍යාව

05) **ශ්‍රී ලංකාවේ පළාත් අනුව වනාන්තර හා ජන ඝනත්වය 2019**

| පළාත | වන ඝනත්වය (Km²) | ජන ඝනත්වය (ව.කි.මී. 1 ට) |
|---|---|---|
| බස්නාහිර පළාත | 195 | 1706 |
| මධ්‍යම පළාත | 1402 | 493 |
| දකුණු පළාත | 932 | 490 |
| උතුරු පළාත | 3946 | 136 |
| නැගෙනහිර පළාත | 3030 | 183 |
| වයඹ පළාත | 1002 | 338 |
| උතුරු මැද පළාත | 3326 | 140 |
| ඌව පළාත | 2000 | 164 |
| සබරගමුව පළාත | 765 | 416 |

මූලාශ්‍රය : සමාජ ආර්ථික දත්ත, 2019 - ශ්‍රී ලංකා මහ බැංකුව

i) වනාන්තර ව්‍යාප්තියට සාපේක්ෂව ජන ඝනත්වය අඩු ම පළාත හා වැඩි ම පළාත නම් කරන්න. (ල.2)

ii) ජන ඝනත්වය වැඩි පළාත්වල වන ඝනත්වය අඩුවීමට බලපා ඇති සාධක පැහැදිලි කරන්න. (ල.6)


iii) සංවර්ධිත රටවලට වඩා වැඩි මානුෂ සංවර්ධන දර්ශක අගයක් ශ්‍රී ලංකාව සතු වීමට බලපෑ හේතු සාකච්ඡා කරන්න. (ල.6)

iv) ශ්‍රී ලංකාවේ පුම්තිරි අනුපාතයේ වෙනස්වීම සමාජ ආර්ථික කටයුතු කෙරෙහි බලපාන ආකාරය විස්තර කරන්න. (ල.6)

06) i) නිෂ්කර්ෂක කර්මාන්ත යන්න හඳුන්වන්න. (ල.3)

ii) ආකර කර්මාන්තය සිදුකරන ප්‍රධාන කැණීම් ක්‍රම දෙක නම් කර ඒවා උදාහරණ සහිතව කෙටියෙන් හඳුන්වන්න. (ල.6)

iii) සිතියමේ දක්වා ඇති ලෝකයේ ප්‍රධාන ගල් අඟුරු නිෂ්පාදනය කරන රටවල් නම් කරන්න. (ල.5)




iv) ඛනිජ සම්පත් උපයෝජනයේ දී පරිසරයට සිදුවන අහිතකර බලපෑම් තුනක් විස්තර කරන්න. (ල.6)


07) i) බස්නාහිර, උතුරු හා නැගෙනහිර පළාත්වල නාගරික ජනගහණ ප්‍රතිශතය වැඩි දිස්ත්‍රික්ක කිහිපයක් ලකුණු කර ඇත. ඒ ඒ පළාත තුළ වැඩි ම නාගරික ජනසංඛ්‍යාවක් වාසය කරන දිස්ත්‍රික්ක තුන නම් කරන්න. (ල.3)

ii) a). ශ්‍රී ලංකාවේ නාගරීකරණයේ ක්‍රමික වර්ධනය සිදුවන ප්‍රධාන ක්‍රම තුන දක්වන්න. (ල.3)

b). ලොව හඳුනාගෙන ඇති නාගරික සමූහිත හතරක් නම් කරන්න. (ල.2)

iii) සංවර්ධනය වෙමින් පවතින රටවල නාගරීකරණය ආශ්‍රිත ගැටළු තුනක් විස්තර කරන්න. (ල.6)

iv) ශ්‍රී ලංකාවේ නාගරීකරණය ආශ්‍රිත ව නිර්මාණය වී ඇති ගැටළු විසඳීමට රජය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග තුනක් විස්තර කරන්න. (ල.6)




08) i) **ඛනිජ සම්පත්** යන්න අර්ථ දක්වන්න. (ල.2)

ii) ශ්‍රී ලංකාවේ හමුවන ආර්ථික වශයෙන් වඩාත් වැදගත්වන ඛනිජ වර්ග තුන හා ඒවා හමුවන ප්‍රදේශයක් බැගින් නම් කරන්න. (ල.6)

iii) කාර්මික අමුද්‍රව්‍යක් ලෙස ශ්‍රී ලංකාවේ ඛනිජ සම්පත්වල ඇති වැදගත්කම පැහැදිලි කරන්න. (ල.6)

iv) ඛනිජ සම්පත් උපයෝජනයේ දී සිදුවන්නාවූ පාරිසරික හානි අවම කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග තුනක් විස්තර කරන්න. (ල.6)

දෙවන පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2020

இரண்டாம் தவணை பரீட்சை - நரம் 12 - 2020

Second Term Test - Grade 12 - 2020




SCALE 1:50,000

දෙවන පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020

இரண்டாம் தவணை பரீட்சை - தரம் 13 - 2020

# Second Term Test - Grade 13 - 2020




SCALE 1:50,000